00301

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ**

**ඩිප්ලෝමා වැඩ සටහන - 3 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2014**

**ESD 1230 – ළමා සංවර්ධනය I**

**කාලය - පැය 03 යි.**

---

දිනය - 2014.11.15 වේලාව - පෙ.ව. 09.30 - ප.ව.12.30

---

**පළමුවන කොටසේ සියළුම** ප්‍රශ්නවලටද **දෙවන කොටසේ** තෝරාගත් ප්‍රශ්න **තුනකට ද** පිළිතුරු සපයන්න.

**පළමුවන කොටස**

01. "16 වන සියවසට පෙර ළමයා වැදගත් පුද්ගලයකු ලෙස සලකා නැත."
අවම වශයෙන් උදාහරණ දෙකක් (02) ආශ්‍රයෙන් උක්ත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

02. ළමා සංවර්ධනයේ ප්‍රධාන මාන කෙටියෙන් පැහැදිලි කරන්න.

03. එරික් එරික්සන් ඉදිරිපත් කරන ලද මනෝ සමාජීය සංවර්ධන අවධි මාලාවට අයත් අවධීන් පහ (5) ලැයිස්තුගත කරන්න.

04. පෙරපාසල් ගුරුවරියක වශයෙන් ඔබ අවධාන ඌණතා අක්‍රමතාව සහිත ළමයෙකු රැක බලා ගන්නේ සහ ආරක්ෂණය සළසන්නේ කෙසේ ද?

05. පෙරපාසල් ගුරුවරියක ලෙස ළමයින්ගේ ආත්ම සම්මානය සංවර්ධනය සුසාධ්‍ය කිරීම සඳහා භාවිත කළහැකි ක්‍රියාමාර්ග මොනවා ද? ( අවම වශයෙන් 3 ක් )

06. මොළය සංවර්ධනයෙහි ලා පෝෂණයේ භූමිකාව පැහැදිලි කරන්න.

07. ළමයින්ගේ සෘණාත්මක චිත්තවේග මඟ හැරවීම සඳහා පෙර පාසල් ගුරුවරියකට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් (03) උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

08. 'ගවේෂණය' භාවිතයෙන් ළමයින්ගේ ඉගෙනුමට ඔබ පහසුකම් සළසන්නේ කෙසේදැයි උදාහරණයක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 x 8 = 40)

## දෙවන කොටස

09. i. ළමයින්ගේ භාෂා සංවර්ධනය සම්බන්ධව ඉදිරිපත්ව ඇති මනෝවිද්‍යාත්මක මතවාද දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. තෝරා ගන්නා ලද මනෝ විද්‍යාත්මක මතවාදවලට අනුව ළමයින්ගේ භාෂා සංවර්ධනය ඉහළ නැංවීමෙහි ලා පෙර පාසල් ගුරුවරියගේ කාර්ය භාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. i. සාම්ප්‍රදායික බුද්ධිමය ප්‍රභේදයන්ට එරෙහිව අලුතින් හඳුන්වා දුන් බුද්ධිමය ප්‍රභේද විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

ii. ළමයින්ගේ විවිධාකාර බුද්ධිමය ප්‍රභේදවලට ගැළපෙන ක්‍රියාකාරකමක් සැළසුම් කර එය පෙර පාසල් ළමයින් සම්බන්ධයෙන් භාවිතා කළ යුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 12)

11. i. පූර්ණ බලාධිපත්‍යය සහ නම්‍යශීලී දෙමාපිය ශෛලීන් තුළ නිර්මාණය වන ළමයින්ගේ ගති ලක්‍ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. තම ළමයින් මනා ලෙස හදාවඩා ගැනීමට උක්ත දක්වන ලද දෙමාපිය ශෛලීන්ට අයත් දෙමාපියන්ට ඔබ පෙර පාසල් ගුරුවරියක ලෙස උපදෙස් දෙන්නේ කෙසේ ද? (ලකුණු 12)

12. i. 'පවුල හා පාසල මඟින් එල්ල වන පීඩනය හේතුවෙන් මධ්‍යම ළමාවියට අයත් ළමයින්ගේ සමාජ හා චිත්තවේගික කුසලතා සංවර්ධනය සඳහා ඇත්තේ සීමිත අවස්ථා ප්‍රමාණයකි.'
උදාහරණ ආශ්‍රයෙන් උක්ත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

ii. ළමයින්ගේ සමාජ හා චිත්තවේගික ගැටලු මඟ හරවා ගැනීම සඳහා පෙර පාසල් ගුරුවරියක වශයෙන් ඔබ මැදිහත් වන්නේ කෙසේ ද? (ලකුණු 10)

13. පහත ඕනෑම මාතෘකා දෙකක් (2) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ළමා සංවර්ධනය කෙරෙහි ආරයේ හා පරිසරයේ බලපෑම.
ii. ළමයින් තුළ ආත්ම සංකල්පය සංවර්ධනය කිරීම.
iii. ළමයින්ගේ මතකය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග
iv. ළමයින්ගේ අවධානය හා සංජානනය ඉහළ නැංවීම.

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.

003

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF EDUCATION**
**FINAL EXAMINATION – 2014**

**DIPLOMA IN EARLY CHILDHOOD & PRIMARY EDUCATION – LEVEL 3**
**ESD1230 – CHILD DEVELOPMENT I**
**DURATION – THREE (03) HOURS.**

---

Date: 15th November 2014 Time: 9.30 a.m. 12.30 p.m.

---

**Answer all the questions in Part I and any three (03) questions from Part II.**

## PART I

01. 'Child was not considered as an important person prior to the 16th century'. Discuss the above statement with at least **two (02)** examples.

02. Explain briefly the main domains of child development.

03. List out the 1st five psycho social developmental stages presented by Eric Erickson.

04. As a pre-school teacher, how would you provide care and protection for children with Attention Deficit Disorders?

05. What procedures would you apply as a pre-school teacher to facilitate the development of self esteem in children? (At least **three (03)** procedures should be explained)

06. Explain the role of nutrition in line with development of brain.

07. Citing examples explain **three (03)** steps which could be taken by a pre-school teacher in order to overcome negative emotions of children.

08. Using an example, explain how you would facilitate children's learning using exploration?

(5 x 8 = 40 marks)

003Q1

## PART II

09. i. Explain two psychological views presented on language development of children.

(10 marks)

ii. Explain the role of pre-school teacher in promoting language development of children in line with the selected psychological views?

(10 marks)

10. i. Analyze newly introduced new intelligences against traditional types of intelligence.

(08 marks)

ii. Design an activity to suit the different types of intelligences of children and explain how it should be used with pre-school children.
(At least 3 types of intelligence should be covered)

(12 marks)

11. i. Explain the characteristics of children produced by families with authoritarian and permissive parenting style.

(08 marks)

ii. As a pre-school teacher how would you advice the parents of above mentioned parenting styles to raise their children in a better manner?

(12 marks)

12. i. 'There are less opportunities for children of middle childhood to develop their social and emotional skills due to the pressure of family and school'. Critically analyze above statement using examples.

(10 marks)

ii. As a pre-school teacher how would you intervene to overcome social and emotional problems in children in your classroom?

(10 marks)

13. Write short notes on any **two (02)** of the following.
- i. Impact of heredity and environment on child development
- ii. Developing self concept in children.
- iii. Procedures to promote memory in children.
- iv. Promoting attention and perception of children.

(10 x 2 = 20 marks)

-Copyrights reserved -